# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
|---|---|
| දිනය | 2025 පෙබරවාරි 10 |

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳව ඉහළ මට්ටමේ කාර්ය සාධක බලකායක් පිහිටුවීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ ශ්‍රී ලංකාවේ තුන්වන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම**

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG) විසින් සම්බන්ධීකරණය කරනු ලබන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ ශ්‍රී ලංකාවේ තුන්වන අන්‍යෝන්‍ය ඇගයීම නුදුරු අනාගතයේ දී ආරම්භ වීමට නියමිතය. මූල්‍ය කාර්ය සාධක බලකායේ (මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ගෝලීය ප්‍රතිපත්ති සම්පාදක) නිර්දේශ 40 සම්බන්ධයෙන් දක්වන තාක්ෂණික අනුකූලතාව මෙන්ම ක්ෂණික ප්‍රතිඵල 11 ක් හරහා ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කෙරෙන බව මෙම අන්‍යෝන්‍ය ඇගයීම තුළ දී ශ්‍රී ලංකාව විසින් පෙන්නුම් කළ යුතුය.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුවේ පවතින දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගෙනහැර දක්වන, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති, ක්‍රියාකාරී සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා රේගුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අධිකරණ අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය, සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව යන අදාළ පාර්ශ්වකාර ආයතන වෙත දැනුම් දී ඇත. ආයතන අනුව සකස් කරන ලද එම ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සහ පසු විපරම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවයෙන් 2023 වසරේ දී මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ කාර්ය සාධක බලකායක් ද ස්ථාපිත කරන ලදී.

මෙම ක්‍රියාවලිය සඳහා රජයේ සහයෝගය සහතික කරමින්, ශ්‍රී ලංකාවේ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා රජය ගෙනයන ප්‍රයත්නයන්ට අනුකූලව අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි, එම මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ කාර්ය සාධක බලකාය ඉහළ මට්ටමේ අමාත්‍ය නියෝජනයක් සහිතව ප්‍රතිසංවිධානය කර ඇත. මෙම ඉහළ මට්ටමේ කාර්ය සාධක බලකායේ සාමාජිකයින් පහත පරිදි වේ:

i. ගරු විනිසුරු බුවනෙක අළුවිහාරේ මහතා, ජනාධිපති නීතිඥ - විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (සභාපති)
ii. ගරු හර්ෂණ නානායක්කාර මහතා - අධිකරණ අමාත්‍ය
iii. ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා - කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය
iv. ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා - මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය
v. නෙලුමනී දවුලගල මහත්මිය - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
vi. ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2025 ජනවාරි 29 දින පැවති එහි පළමු රැස්වීමේදී, කාර්ය සාධක බලකායේ සභාපතිවරයා සහ එහි සාමාජිකයින් විසින් අන්‍යොන්‍ය ඇගයීමේ උපායමාර්ගික වැදගත්කම ඉස්මතු කරන ලද අතර, මෙම තීරණාත්මක ඇගයීමට සාර්ථකව මුහුණ දීම සඳහා සෑම පාර්ශ්වකරුවෙකුගේම පූර්ණ සහයෝගීතාවය ඉල්ලා සිටින ලදී.